ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2024.05.27 |

| | | | |
|---|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | | එෆ්.ආර්. නාලිනී සිල්වා මිය.<br>බී/24/2, ඇළ පාර,<br>කාකදූපත,<br>කොළඹ 15. |
| වගඋත්තර පාර්ශවය | : | 01. | සභාපති,<br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,<br>සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,<br>කොළඹ 02. |
| | | 02. | සාමාන්‍යාධිකාරී,<br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,<br>සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,<br>කොළඹ 02. |
| පැමිණිලි අංකය | : | | HRC/1989/22 |

**පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු :-**

1984 වසරේ සිට පැමිණිලිකාරියගේ මව වන වලිමුණි ගර්ලින් ජුලියට් ෆොන්සේකා ගුණසේකර යන අය කොළඹ 15, කාකදූපත, ඇළ පාර, බී/24/2 දරණ ස්ථානයෙහි පිහිටි නිවස වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමග විකිණීමේ පොරොන්දු ගිවිසුමකට බැඳී සිටි බවත්, එකී ගිවිසුම ප්‍රකාරව අදාළ ගෙවීම් කටයුතු මව විසින් සිදු කර අවසන්ව තිබුණද ඔප්පුව ලබා දීමට වගඋත්තර පාර්ශවය කටයුතු කර නොමැති බව පැමිණිලිකාරිය තම පැමිණිල්ල මඟින් දක්වා ඇත.

මව මියයාමෙන් අනතුරුව පැමිණිලිකාරිය එම දේපලේ පදිංචිව සිටිමින් සියළු වැඩිදියුණු කිරීම සිදු කළ බවත්, සුනාමි තත්ත්වය මත කඩා වැටෙන තත්ත්වයට පත්ව තිබූ නිවස අලුත්වැඩියා කිරීමට සිදුවූ බවත්, ඒ අනුව නිවස සඳහා ඔප්පුව ලබා දීමට තම් අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කළ යුතු බවට වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකාරියට දන්වා තිබූ බවත්, පසුව වගඋත්තරකරුවන් විසින් 2017.02.17 වන දින අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පැමිණිලිකාරිය විසින් නිවස අලුත්වැඩියා කිරීමේදී එක් කළ කොටස් අනවසර ඉදිකිරීම් ලෙස සලකා කඩා බිඳ දැමීමට නියෝග කළ බවත්, අධිකරණ නියෝගයට පිටුපා පැමිණිලිකාරිය ද



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

බලහත්කාරයෙන් නිවසෙන් එළියට ඇද දමා යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් නිවසේ බඩු භාණ්ඩ විශාල ප්‍රමාණයක් විනාශ වී යන ලෙස ඉදිකිරීම් කඩා බිඳ දැමීමට කටයුතු කළ බවත්, ඒ පිළිබඳව කොළඹ මහාධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව භුක්තිය නැවත ලබා ගත් නමුත් නිවසට අදාළ ඔප්පුව ලබාදීමට නම් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට වැය වූ මුදල වන රු.673,000/-ක මුදලක් වගඋත්තරකරුවන් ඉල්ලා සිටි බවත් පැමිණිලිකාරිය තම පැමිණිල්ල මඟින් වැඩිදුරටත් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකරුවන් විසින් පැමිණිල්ලට අදාළව වාර්තාවක් ඉදිරිපත් කරමින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාරිය පදිංචිව සිටින නිවස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදි කළ නිවාස සංකීර්ණයේ පිහිටි මට්ටක්කුලිය කාකඳූපත නිවාස යෝජනා ක්‍රමයේ අංක බී 24/2 දරණ නිවස වන බවද එෆ්.ආර්.එන්. සිල්වා වන මෙම පැමිණිලිකාරිය වසර 40කට වැඩි කාලයක් එම නිවසේ ජීවත්ව සිටි බවද පැමිණිලිකාරිය සිදු කළ අනවසර ඉදිකිරීමක් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගය පරිදි කඩා ඉවත් කළ බවද සඳහන් කර ඇත.

අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට වැය වූ මුදල සහ නීති කටයුතු සඳහා වැය වූ මුදල පැමිණිලිකාරියගෙන් අය කර ගැනීමට කටයුතු කරමින් සිටියද, පසුව මෙම මුදල පැමිණිලිකාරියගෙන් අය නොකර සහනදායී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරමින් නිවසේ අයිතිය පවරා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු කරමින් සිටියදී පැමිණිලිකාරියගේ සහෝදරියක් වන විදෙස් ගතව සිට පැමිණි ඊ.එම්. ශ්‍රියාණි ජසින්තා යන අය විසින්ද මෙම නිවසට තමාටද හිමිකම් ඇති බව පවසමින් 2023.08.03 වන දිනැතිව ලිපියක් ඉදිරිපත් කර තිබීම මත පරීක්ෂා කර බලා අධිකාරියේ චක්‍රලේඛ අනුව නිවස පැවරීමේ කටයුතු සිදු කරන බව සඳහන් කර ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය කර ගත් කරුණු :-**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරිය පදිංචි දේපල නිවාස සංවර්ධන අධිකාරිය සතු දේපලක් බවත්, එකී දේපල එනම්, නිවස ගිවිසුමක් ප්‍රකාරව පැමිණිලිකාරියගේ මවට ඊට අදාළ මුදල් ගෙවීමෙන් අනතුරුව ඔප්පුව ලබාදීමේ පදනම මත ලබාදී ඇති බවත්, 1984 වසරේ සිට පැමිණිලිකාරිය මව සමග එම ස්ථානයේ පදිංචි බව පිළිගන්නා බවත්ය. 1980.09.28 දින සිට මෙම දේපලට අදාළ ගිවිසුම දෙපාර්ශවය අතර ඇති කරගෙන තිබෙන බවද පැමිණිලිකාරිය මෙම දේපලේ යම් යම් ඉදිකිරීම් අනවරයෙන් සිදු කළ පසු ප්‍රදේශවාසීන් ඉදිරිපත් කළ පෙත්සම් සලකා බලා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට පැමිණිලිකාරියට දන්වා තිබූ බවද සඳහන් කර ඇත.

මෙහිදී පැමිණිලිකාරිය සඳහන් කර ඇත්තේ, මෙම නිවාස යෝජනා ක්‍රමයේ සියළුම නිවැසියන් පදිංචි වී දීර්ඝ කාලයක් ගත වූ පසු තම නිවාස වල විවිධ වෙනස්කම් සිදු කර ගන්නාමුත් එවැනි සියළුම ඉදිකිරීම හෝ සංවර්ධනය කර ගැනීම් අවසරයක් ඇතුව කර ගන්නා බවක් පෙනී නොයන බවයි. ඒ අනුව විවිධ කොටස් එනම්,

සඳළුතල, කාමර කොටස් තාප්ප හෝ නව ඉදිකිරීම් කරගෙන ඇති බවද එකී සියළුම තැනැත්තන්ගේ ඉදිකිරීම් අනවසර වුවද තමාට පමණක් එරෙහිව වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බවද දක්වයි.

පැමිණිලිකාරිය ඡායාරූප ඉදිරිපත් කරමින් ඉහත කරුණු තහවුරු කරනු ලබන අතර, වැඩිදුරටත් එකී ඡායාරූප මගින් පෙන්වා දෙන්නේ වගඋත්තරකරුවන් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කිරීමේදී පැමිණිලිකාරියගේ ඉදිකිරීම් පමණක් අනවසර බව දක්වා කඩා ඉවත් කිරීමට නියෝගයක් ලබාගනිමින් එම ඉදිකිරීම් කඩාදැම්මට කටයුතු කරන ලද්දේ අධිකරණ නියෝගයේ කරුණු වලටද පටහැනිව බවය. එනම්, අධිකරණ නියෝගයට අනුව, නිවස හෝ නිවසේ උපකරණ වලට හානි නොවන ලෙස මිනිස් ශ්‍රමය භාවිතා කර කඩා ඉවත් කිරීම් සිදු කරන ලෙස වුවද යන්ත්‍රෝපකරණ හා බැකෝ යන්ත්‍ර භාවිතා කර කටයුතු කිරීමෙන් තම නිවසේ බඩු භාණ්ඩ හා විදුලි උපකරණ මෙන්ම පදිංචිව සිටි නිවසේ බිත්ති හා පහත මාලයේ බිමට ද හානි වූ බව දක්වයි.

මෙහිදී පැමිණිලිකාරිය කියා සිටින කාරණාවක් වන්නේ පැමිණිලිකාරිය භුක්තියෙන් නෙරපා හැරීමට පවා වගඋත්තරකරුවන් කටයුතු කරමින් අධිකරණ නියෝගය ලබාගැනීමට කටයුතු කළද තමා විසින් මහාධිකරණයට කරුණු දක්වා සිටීමෙන් අනතුරුව භුක්තියෙන් නෙරපා හැරීමට වගඋත්තරකරුවන්ට අවසර නොදුන් අතර, අනවසර ඉදිකිරීම් පමණක් ඉවත් කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගය ප්‍රකාරව ඉඩ ලබාදෙන ලද බවය. ඉහත කී පරිදි අධිකරණ නියෝගයද පැහැර හරිමින් යන්ත්‍රසූත්‍ර යොදා තම නිවසට ද හානි සිදු කර නිවාස අධිකාරියේ සන්තකයට නිවසේ අයිතිය නැවත යටත් කර විදුලි බිල පවා නිවාස අධිකාරියේ සභාපති නමින් නිකුත් කරවා ගන්නා ලද අතර, අදාල නිවාසය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර ඇති කර ගන්නා ලද ගිවිසුම අනුව ගෙවියයුතු මුදල් ගෙවා අවසන් කර තිබියදී වගඋත්තරකරුවන් කටයුතු කරන ලද්දේ එකී ගිවිසුම පවා නොසලකා හරිමින් බව පැමිණිලිකාරිය වැඩිදුරටත් පෙන්වා දී ඇත.

මෙහිදී අධිකරණ නියෝගයේ සඳහන් වන ලද්දේ, මිනිස් ශ්‍රමය යටතේ කුලීකරුවන් යොදා ආරක්ෂා සහිතව අනවසර ඉදිකිරීම් ඉවත් කළයුතු බවට වන බව වගඋත්තර පාර්ශවය විසින් ද පිළිගෙන ඇති අතර, එහිදී යන්ත්‍රසූත්‍ර භාවිතා කිරීමට දන්වා නොතිබූ බවද පිළිගෙන ඇත. ඒ අනුව අධිකරණ නියෝගයට පටහැනිව කටයුතු කල බව වගඋත්තර පාර්ශවය විසින්ද 2023.05.10 දින මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද පරීක්ෂණයේදී පිළිගෙන ඇත.

2023.07.21 දින පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිලිකාරියගේ මව ගිවිසුම් ගතව ඇති මෙම ප්‍රශ්නගත දේපළ සඳහා ගෙවියයුතු සියළු ගෙවීම් කටයුතු අවසන් කර තිබීමත්, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සම්බන්ධයෙන් ලබා දී ඇති අධිකරණ නියෝගය ප්‍රකාරව වගඋත්තරකරුවන් විසින් කටයුතු නොකරමින් පැමිණිලිකාරියගේ දේපළට දැඩි හානි සිදු කර තිබීමත් යන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස වගඋත්තරකාර පාර්ශවයට විශේෂයෙන් පෙන්වා දී ඇත.

තවද, වගඋත්තර පාර්ශවය විසින් අධිකරණයේ නියෝගයට පටහැනිව කටයුතු කර දේපළට ද හානි සිදු කිරීමෙන් පසුව අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට යන්ත්‍රසූත්‍ර සඳහා වැය වූ මුදල් ලෙස රු.673,000/-ක මුදලක් ඉල්ලා සිටීමත්, පැමිණිලිකාරිය පිළිකා රෝගයකින් පෙළෙන කාන්තාවක් වීම හා මෙම දේපළේ වසර 40ක පමණ වූ පදිංචිය පවතින බවට වගඋත්තර පාර්ශවයද පිළිගෙන තිබීමත් පිළිබඳව සලකා බලා පැමිණිලිකාරියගේ

ඉල්ලීම නිවසේ ඔප්පුව ලබාගැනීම වන බැවින් ඒ සඳහා තවදුරටත් බාධා කිරීමකින් තොරව කටයුතු කිරීම සුදුසු බවට වගඋත්තර පාර්ශවය වෙත පෙන්වා දී ඇත.

**නිරීක්ෂණ හා නිගමන :-**

පැමිණිලිකාරියගේ පැමිණිල්ල, වගඋත්තරකරුගේ ඊට අදාළ පිළිතුරු වාර්තා, දෙපාර්ශවයේ ලිඛිත දේශන සහ පරීක්ෂණ දින ඉදිරිපත් කරන ලද සියළු කරුණු වෙත අවධානය යොමු කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය වේ.

කොළඹ 15, මට්ටක්කුලිය, කාකදූපත නිවාස ක්‍රමයේ බී.24/2 දරණ නිවස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදි කළ නිවාස යෝජනා ක්‍රමයේ ඇති එක් නිවසක් පමණක් බව පෙනී යන අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු අනිකුත් නිවාස මෙන්ම මෙම නිවස ද ගිවිසුම්ගත වූ තැනැත්තන් සමග ඇති කරගත් විකිණීමේ ගිවිසුමකට අනුව භුක්තිය භාර දී පැවති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව ඉහත අංක දරණ නිවස පැමිණිලිකාරියගේ මවගේ නමින් 1984 වර්ෂයේ සිට ගිවිසුම්ගතව තිබී ඇති අතර, එකී විකිණීමේ ගිවිසුමට අදාළ ගෙවීම් කටයුතු සිදු කර අවසන් වූ පසු අදාළ නිවස ඔප්පු මගින් පවරා භාරදිය යුතු වුවත් වගඋත්තරකරුවන් එය පැහැර හරිමින් කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරියගේ මව මියයාමෙන් අනතුරුව තවදුරටත් මෙම දේපළ වැඩිදියුණු කරමින් භුක්තියේ හා හිමකමේ රැඳී සිටින ළද්දේ පැමිණිලිකාරිය බවත්, ඇය වසර 40ක් පමණ මෙම නිවසේ පදිංචිව සිට ඇති බවත් පරීක්ෂණ අවස්ථා වලදී වගඋත්තර පාර්ශවය විසින් පිළිගෙන ඇති බව නිරීක්ෂණය වේ.

මෙම නිවස වැඩිදියුණු කරන අවස්ථා වලදී පැමිණිලිකාරිය නිවසේ තවත් කොටස් සංවර්ධනය කරමින් නිවස වැඩිදියුණු කර ඇතත් එය නිසි අවසරයක් මත සිදු කර නොමැති බව පෙනී යන අතර, මේ සම්බන්ධව යාබද නිවැසියන් විසින් ගොනු කළ පෙත්සමක් මත පදනම්ව වගඋත්තරකරුවන් විසින් අධිකරණ ක්‍රියාමාර්ගයට යොමුව ඇත. ඒ අනුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් නියෝග කර ඇත්තේ යන්ත්‍රෝපකරණ භාවිතා කිරීමකින් තොරව මිනිස් ශ්‍රමය භාවිතා කරමින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස වුවත් වගඋත්තරකරුවන් විසින් කොළඹ මහ නගර සභාවේ ඇති යන්ත්‍රෝපකරණ රැගෙන විත් අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් ලබාදුන් අධිකරණ නියෝගයට පටහැනි වන අතර, ඒ බව පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුවන් විසින් ද පිළිගෙන ඇති බව නිරීක්ෂණය වේ.

තවද වගඋත්තරකරුවන් විසින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් නියෝග කළ පරිදි මිනිස් ශ්‍රමය භාවිතා කිරීමකින් තොරව යන්ත්‍රෝපකරණ භාවිතා කරමින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කිරීම හරහා පැමිණිලිකාරියගේ නිවසේ ගෘහ භාණ්ඩ හා උපකරණ බොහෝ ප්‍රමාණයක් විනාශ වී ඇති බව පැමිණිලිකාරිය විසින් ඡායාරූප ඉදිරිපත් කරමින් තහවුරු කර ඇති අතර පිළිකා රෝගයකින් පෙළෙන පැමිණිලිකාරිය ඉන් බරපතළ පීඩාවකට ලක්ව තිබෙන බව ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය විසින් තමා භුක්තියෙන් නෙරපා හැරීමට කටයුතු කිරීම සම්බන්ධව ඉහත කී අධිකරණය නියෝගයට එරෙහිව කොළඹ මහාධිකරණය වෙත ඉදිරිපත්ව කරුණු දැක්වීමෙන් අනතුරුව, පැමිණිලිකාරියගේ දීර්ඝ කාලීන පදිංචිය නොසලකා හරිමින් භුක්තියෙන් නෙරපා හැරීම නිවැරදි නොවන බවත්, අනවසර ඉදිකිරීම් ඉවත් කළ ද භුක්තියෙන් නෙරපා හැරීමක් කිරීමට නොහැකි බවත් මහාධිකරණය විසින් නියෝග කර ඇත.

පැමිණිලිකාරියගේ නිවසට අදාළ ඔප්පුව ලබාදීම සඳහා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට වැය වූ මුදල සහ නීති කටයුතු සඳහා වැය වූ මුදල වන රු.673,000/-ක මුදල වගඋත්තරකරුවන් විසින් ඉල්ලා සිටි බවට පැමිණිලි පාර්ශවය දක්වා ඇතත්, එම මුදල පැමිණිලිකාරියගෙන් අය නොකර සහනදායී ක්‍රියාපිළිවෙතක් මගින් නිවසේ අයිතිය පවරා දීමට වගඋත්තරකාර පාර්ශවයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතින අතරතුර පැමිණිලිකාරියගේ සහෝදරියක් යයි සඳහන් කරනු ලබන ජසින්තා මෙන්ඩිස් නම් අයෙකු විසින් ජර්මන් රාජ්‍යයේ පදිංචිව සිටිමින් නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීමක් කරමින් තමාටද එම නිවසේ අයිතිවාසිකමක් ලබාදෙන ලෙස ඉල්ලා තිබීම මත පැමිණිලිකාරිය වෙත ඔප්පුව ලබාදීම ගැටළුවක් බව වගඋත්තරකරුවන් විසින් පෙන්වා දී ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් තානාපති කාර්යාල මගින් පැමිණිලිකාරියගේ සහෝදරියක යයි සඳහන් කරනු ලබන ජසින්තා මෙන්ඩිස් යන අය සම්බන්ධව ශ්‍රී ලංකාවේ පුරවැසි භාවය පිළිබඳ විමසීමට කටයුතු කරන ලද බවද දක්වා තිබීම මත, කොමිෂන් සභාව විසින්ද විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් මේ පිළිබඳ විමසීම් කර ඇත. ඒ අනුව මෙතෙක් ඉදිරිපත්ව ඇති කරුණු අනුව පෙනී යන්නේ මේරි ජසින්තා යන අය ජර්මන් රජය යටතේ ස්ථිරව පදිංචිව සිටින තැනැත්තියක් බවයි.

මෙහිදී පැමිණිලිකාරිය විසින් සඳහන් කර සිටින්නේ ඉහත කී ජසින්තා මෙන්ඩිස් යන අය ජර්මන් රජයේ සුභසාධක පහසුකම් යටතේ එනම්, Social –AMT හෙවත් UBbe- Visit ලෙස සිටින බවත්, එකී සියළුම පහසුකම් ජර්මන් රජයෙන් ඇය වෙත ලබාදෙන්නේ කිසිදු දේපළක් හෝ වත්කමක් කිසියම් රටක හිමිකම් නොමැති අය වෙනුවෙන් බවත් ය.

ඒ අනුව එකී පහසුකම් යටතේ සිටින මෙම සහෝදරිය, ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ඔප්පුවක් ලබාගැනීමට අපේක්ෂා කරන්නේ පදිංචි වීමක් සඳහා නොවන බව පෙනී යන අතර, එය විකිණීමට හෝ අන්සතු කිරීමට ඇති ඉඩකඩ බැහැර කළ නොහැක.

කෙසේ වෙතත් පැමිණිලිකාරිය මෙම විෂයගත දේපළෙහි වසර 40කට වඩා වැඩි කාලයක් පදිංචිව සිටිමින් එකී නිවසේ සංවර්ධන කටයුතු සිදු කරගනිමින් සිටින අතර, එකී නිවසේ පැමිණිලිකාරිය හැර වෙනත් හිමිකම් කිවහැකි තැනැත්තියක පදිංචිව සිටින බවක් අනාවරණය වී නොමැත. අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කිරීමට එරෙහිව මහාධිකරණය වෙත පැමිණිලිකාරිය ඉදිරිපත්ව භුක්තිය ඉල්ලා සිටින විට වෙනත් හිමිකම් කී තැනැත්තෙකු හෝ ඉහත නම් සඳහන් සහෝදරියක හෝ නොවූ බව ද නිරීක්ෂණය වේ. එමෙන්ම පැමිණිලිකාරිය ඉදිරිපත් කළ වෛද්‍ය සහතික අනුව ඇය පිළිකා රෝගයකින් පෙළෙන කාන්තාවක බව ද වෙනත් කාගේ හෝ පිළිසරණක් නොමැතිව මෙම නිවසේ දීර්ඝ කාලයක සිට පදිංචිව සිටින බවද අනාවරණය වේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා පැමිණිලිකාරියගේ මව අතර පවතින්නේ ගිවිසුමක් පමණක් වන අතර, පැමිණිලිකාරියගේ මවගේ නමට දේපලේ ඔප්පුව ලබාදී නොතිබුණු බැවින් මවගේ අයිතිවාසිකම් ඉල්ලා සිටීමට පැමිණිලිකාරිය සතුව ඔප්පුවක් නොමැත. ඒ අනුව, ගිවිසුම්ගත පාර්ශවයක් මියගිය පසු ගිවිසුම අවලංගුවූවා සේ සැලකිය හැකි බැවින් පවතින ගිවිසුම්ගත කරුණු අනුව විෂයගත දේපළෙහි පදිංචිකරු පිළිබඳව සලකා බලා මියගිය මව විසින් කරන ලද සියළු ගෙවීම් කටයුතු අනුව පැමිණිලිකාරිය සමඟ නව ගිවිසුමකට එළඹීමට වගඋත්තර පාර්ශවයට හැකියාවක් පවතින බව නිරීක්ෂණය වේ.

එමෙන්ම පරීක්ෂණ අවස්ථාවලදී ඉදිරිපත් වූ කරුණු අනුව අවධානය යොමු කළයුතු වඩාත් වැදගත් කරුණු කිහිපයක් වෙත වගඋත්තරකරුවන්ගේ අවධානය යොමු කළයුතු බවද නිරීක්ෂණය වන අතර ඒවා සරලව පහත පරිදි පෙන්වා දිය හැක. එනම්,

- මෙම විෂයගත කාකදූපත නිවාස යෝජනා ක්‍රමයේ නිවාස අධිකාරිය සතු වෙනත් නිවාස බොහෝ ප්‍රමාණයක් පවතින අතර, එම නිවාසවල අනවසර ඉදිකිරීම් ලෙස සැලකිය හැකි විවිධ නිවාස කොටස් පවතින බවට වගඋත්තර පාර්ශවය විසින් ම පිළිගෙන ඇති බව

- පැමිණිලිකාරියගේ නිවසේ අනවසර ඉදිකිරීම් හැර ඉදිකර ඇති අනෙකුත් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට වගඋත්තර පාර්ශවය විසින් පියවර ගෙන නොමැති බව වගඋත්තර පාර්ශවය විසින් ම පිළිගෙන ඇති බව

**නිගමනය -:**

ඒ අනුව පැමිණිලිකාරියට සහනය ලබාදීමට හැකියාව තිබියදී එය නොසලකා හරිමින් කටයුතු කර තිබීමෙන්ද, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පරිපාලන හා විධායක තීරණ ගැනීමේදී අධිකරණය විසින් දෙන ලද නියෝගයට පටහැනිව පැමිණිල්ලේ දේපළ සම්බන්ධව කටයුතු කර තිබීමෙන්ද, පැමිණිලිකාරිය විසින් කරන ලද ඉල්ලීම් නොසලකා හරිමින් හා අදාළ නිවාස ඔප්පු ලබා ගැනීමට අවශ්‍ය සියලු කටයුතු සම්පූර්ණ කර තිබියදී අදාළ ඔප්පුව ලබාදීමට කටයුතු නොකිරීමෙන් ද 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට ආරක්ෂා කර දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය වන පරිදි කටයුතු කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත නිර්දේශය කර සිටී.**

01. පැමිණිලිකාරිය පදිංචි කොළඹ 15, මට්ටක්කුලිය, කාකදූපත නිවාස ක්‍රමයේ බී24/2 දරණ නිවසේ වසර 40කට අධික කාලයක් පැමිණිලිකාරිය පදිංචිව සිටින බව වගඋත්තරකරුවන් විසින්ද පිළිගෙන ඇති බැවින් හා පැමිණිලිකාරිය පිළිකා රෝගයකින් පෙළෙන රෝගී කාන්තාවක් බව වෛද්‍ය වාර්තා මගින්

තහවුරු කර තිබීම ද සලකා බලා ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනතේ මූලික අරමුණු ද අනුව පැමිණිලිකාරියගේ නිවසේ හිමිකම් ඔප්පුව පැමිණිලිකාරියගේ නමින් ලබාදීමට කටයුතු කළ යුතුය.

02. පැමිණිලිකාරියගේ දේපලේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කිරීමේදී අධිකරණය විසින් ලබාදෙන ලද නියෝගයට පටහැනිව කටයුතු කළ බව වගඋත්තරකරුවන් විසින් පිළිගෙන තිබීම අනුව අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට යන්ත්‍රසූත්‍ර භාවිතා කිරීමේ පිරිවැය වශයෙන් රු.673,000/-ක් හෝ වෙනත් පිරිවැය ගාස්තු ලෙස මුදල් අය නොකළයුතු බවද (මෙම මුදල හා නීති කටයුතු සඳහා වැය වූ මුදල් පැමිණිලිකාරියගෙන් අය නොකිරීමට තීරණය කර ඇති බව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් වාර්තා කිරීම අනුව) දන්වා සිටිමු.

2024.07.18 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය.
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික).
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවග

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත -: ප්‍රසන්න රණතුංග මහතා,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය,
දෙවන මහල, සෙත්සිරිපාය,
ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.

B/